**ශීර්ෂය 276 බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**--------------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**
------------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බදුල්ලදිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 22 වන දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව2021අප්‍රේල් 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020දෙසැම්බර් 31 දිනට බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේපිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
--------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව බදුල්ලදිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව බදුල්ලදිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වනතහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන්හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන්වැනි හේතු නිසා වන බැවිනි.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේඅභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයපිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන අයුරින් සකස් කර තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

**(අ) භාණ්ඩාගාර අග්‍රිම ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව වර්ෂය තුල භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිමය රු.4,674,517,962 ක් වුව ද එය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.4,669,060,143 ක් ලෙස දැක්වීම නිසා රු.5,457,819 ක වෙනසක් නිරීක්ෂණය විය. | භාණ්ඩාගාරයෙන් ලද මුදල් කොවිඩ් ආධාර ලබාදීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදුන්න ද අදාළ කාර්යය සඳහා වියදම් නොවීම හේතුවෙන් එම මුදල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් නැවත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත මුදලින් පියවන අවස්ථාවේදී ද්විගණනයක් සිදුවීම හේතුවෙන් දෙවරක් ලැබුණු අග්‍රිම ලෙස සටහන් කර ඇත. එය ජූනි මස සහ සැප්තැම්බර් මස නැවත පියවීමක් වශයෙන් සඳහන් කර නිවැරදි කරන ලදි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

**(ආ) පුනරාවර්තන වියදම්**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(i)** සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල වැඩ සටහන් අනුව වියදම් සාරාංශය (ඒසීඒ **2(II)** ) හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් **(SA 10)** අනුව | සහනාධාර ප්‍රදාන සහ මාරු කිරීම් වටිනාකම වූ රු.7,902,961.00 ක මුදල මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ අනෙකුත් භාණ්ඩ හා සේවා අයිතමය | අදාල ආකෘතිය අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වුසහනාධාර**,** ප්‍රදාන සහමාරු කිරීම් වටිනාකම රු.**7,902,961** ක් අනෙකුත් භාණ්ඩ හා සේවා වියදම් යටතේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි දක්වා තිබුණි. | යටතේ සඳහන් වටිනාකම තුල ඇතුලත් වී ඇති බව | |
| **(ii)** | වැඩ සටහන් අනුව වියදම් සාරාංශය (ඒසීඒ **2(II) )** හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (**SA 10)** අනුව අනෙකුත් භාණ්ඩ හා සේවා වියදම රු.**83,512,297** ක් වුව ද**,** එම වටිනාකමට සහනාධාර ප්‍රදාන හා මාරු කිරීම් රු.7,902,961 ක් සහ අනෙකුත් පුනාවර්තන වියදම් රු.1,300,000 ක් ලෙස රු.9,202,961 ක් එකතු කර රු.92,715,258 ක් ලෙසට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දක්වා තිබුණි. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ අනෙකුත් භාණ්ඩ හා සේවා අයිතමයේ වටිනාකම තුල සහනාධාර ප්‍රදාන මාරු කිරීම් වටිනාකම වූ රු.7,902,961.00 ක මුදල සහ වෙනත් පුනරාවර්තන වියදම් වටිනාකම මුදල වූ රු.1,300,000.00 ක මුදල ඇතුලත් ව එකතුව රු.92,715,258.00 ලෙස දක්වා ඇති බව | අදාල ආකෘතිය අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |

**1.6.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**
**-------------------------------------**

**මූල්‍ය නොවන වත්කම්**
**-----------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව දේපල**,** පිරියත හා උපකරණ වටිනාකම රු.2,576,254,526 ක් වුව ද**,** භාණ්ඩාගාර මුද්‍රිත සටහන් **SA** – 82 අනුව එය රු.2,575,116,898 ක් වුයෙන් රු.1,137,628 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙය පරිගණක දෝෂයක් වන අතර භාණ්ඩාගාරය විසින් ගිණුමේ දෝෂයක් හේතුකොටගෙන අයිතම කීපයක් ඉවත් කිරීම සිදුකර ඇත. එය 2021.12.31 දිනට තුලනය කිරීම සඳහා භාණ්ඩාගාරය විසින් සිදුකරන ලද වෙනස්කමක් බවත් ඒ සම්බන්ධයෙන් අප විසින් කිසිදු වෙනස් කිරීමක් සිදු නොකල බවත් දන්වමි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

**1.6.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

**මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව වූ සහනාධාර ප්‍රදාන හා මාරු කිරීම් රු.7,902,961 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතේ දක්වා තිබුණි. | සහනාධාර ප්‍රදාන මාරු කිරීම් වටිනාකම වූ රු.7,902,961.00 ක මුදල පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වන රු.818,206,210.00 ක් මුදල තුල ඇතුලත් වී ඇත. ඒ හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන මුදල් ප්‍රවාහයේ වෙනසක් සිදු නොවන බව | අදාල ආකෘතිය අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතුය. |

**1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **විදුලි උපකරණ පිළිබඳ ලේඛනය** | | |
| මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | පසුගිය වර්ෂ වල ලේඛනය පවත්වා ගෙන නොමැති අතර මේ වන විට සකස් කරමින් පවතී | මුදල් රෙගුලාසි 454(2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලිවල සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i)මුදල් රෙගුලාසි396(ඈ) | නිකුත් කර මාස 06 ඉක්මවූ ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ රු.399,950 කචෙක්පත් 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | මුදල් රෙගුලාසි 396 අනුව කටයුතු කළ යුතුය. |
| (ii)මුදල් රෙගුලාසි 571(3) | තැන්පත් කර වසර 02 සිට වසර 04 දක්වා කාල පරාසයක් ගත වී ඇති රු.221,412 ක තැන්පත් 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මහියංගණය ප්‍රා.ලේ.කාර්යාලයට අයත් විගණන විමසුමකට අදාල කටයුතු අවසන් වන තෙක් නිදහස් කළ නොහැකි අතර, වැලිමඩ ප්‍රා.ලේ.කාර්යාලයට අයත් තැන්පතු රු. 174,757.26කට අදාලව විගණන විමසුම් පවතී. රු. 46,655.49 ට අදාල ගෙවීම් කටයුතු සිදු කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා සැලසුම් අංශය වෙත යොමුකර ඇත. | කල් ඉකුත් වූ තැන්පතු නියාදනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** -------------- | | | |
| (i)XIX පරිච්ඡේදයේ 5.2 හා 5.3 වගන්ති | රජයේ නිවාසයක පදිංචි වී සිටින නිලධාරියාගේ වැටුපෙන් හෝ උපලේඛනගත රජයේ නිවාසය හිමි නිලධාරියාගේ වැටුපෙන් ප්‍රතිශතයක් ලෙස නිවාස කුලී අයවිය යුතු වුවද සමාලෝචිත වර්ෂය තුල නිවාස 11 කට අදාල නිවාස කුලී අය කිරීමේදී නිලධාරියාගේ වැටුප් වර්ධක හා වැටුප් පරිවර්තන නොසලකා හැර තිබුණි. | නිලනිවාස කුලිය ගණනය කර අදාල ආයතන වලට දන්වා යවා ඇති අතර කොටස් වශයෙන් අයකර ගැනීමට කටයුතු කරන බව. | ආයතන සංග්‍රහයේ XIXපරිච්ඡේදයේ විධිවිධාන අනුව නිවාස කුලිය අයකර ගත යුතුය. |
| (ii)XIX පරිච්ඡේදයේ 5.6 වගන්තිය | මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාසයක ආර්ථික කුලිය අයකර ගැනීම සඳහා ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් කරන බව | ආර්ථික කුලිය අයකර ගැනීම සඳහා ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතුය |
| (iii)XIX පරිච්ඡේදයේ5.7 වගන්තිය | නිලධාරියා විසින් තනතුරකට හිමි නිවාසයක පදිංචි වීම ප්‍රතික්ෂේප කලවිට නිවාසය හිමි තනතුර දරන නිලධාරියා ගෙවිය යුතුව තිබූ නිවාස කුලිය හා පදිංචිව සිටින නිලධාරියා ගෙවිය යුතු නිවාස කුලිය යන දෙකෙන් වැඩි මුදල වූ රු.267,639 ක මුදල අයකර ගෙන නොතිබුණි. | පදිංචිකරුවන්ගෙන් ඉදිරියේදී අයකරගෙන ගෙන්වා ගැනිමට කටයුතු කරන බව | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව නිවාස කුලිය අයකර ගත යුතුය. |
| (iv)XXIV වන පරිච්ඡේදයේ 1.6 සහ 4 වගන්තිය | බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවයේ නිරතව සිට විශ්‍රාම ලැබූ, වැඩ තහනමට ලක්වූ නිලධාරීන්/ සේවකයින් 04 දෙනෙකුගේ වසර 05 කට | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව ණය ශේෂ අයකර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | අධික කාලයක සිට පැවත එන රු.196,701 ක ණය ශේෂ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 1.6 සහ 4 වගන්ති අනුව කටයුතු කර අයකර ගෙන නොතිබුණි. | | |
| (ඇ) | ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතිකඅයවැය චක්‍රලේඛයේ 3.2 ඡේදය | පළාත් සභාවකට නිලධාරීන් මාරු වී යන්නේ නම් එම පළාත් සභාවෙන් අදාල ණය මුදල් එකවර අයකර ගැනීමට කටයුතු කල යුතු අතර එසේ අයකර ගත නොහැකි නම් මාසික වාරික වශයෙන් හෝ අයකර ගැනීමට කටයුතු කල යුතුය. එසේ වුවද පළාත් සභාවේ ආයතන වලට ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරීන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු වසර 05 කට අධික කාලයක සිට පැවත එන රු.653,965 ක ණය ශේෂයන් 2020 දෙසැම්බර් 31 දින වන විටද අයකර ගෙන නොතිබුණි. | ඌව පළාත් සභාව වෙත ණය ශේෂ නිරවුල් කරන ලෙස දන්වා ඇත. වාරික වශයෙන් හෝ ශේෂ නිරවුල් කිරීමේ කටයුතු සිදු නොකළ බව | චක්‍රලේඛ විධි විධාන අනුව කටයුතු කල යුතුය. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහනයක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | එක් කැබ්රථයක ඉන්ධන පරීක්ෂාව සිදු කර ඇති අතර, අනිත් කැබ් රථයේ ඉන්ධන පරීක්ෂාව සිදු කර නොමැත. | රාජකාරි වාහන වල ඉන්ධන දහනය පරීක්ෂා කල යුතුය. |

## 2.2 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විවිධ ආයතන විසින් සිදු කර තිබුණු වැරදි හර කිරීම් සහ වැරදි බැර කිරීම් හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය යටතේ රු.321,377 ක ණය ශේෂයක්ද ගෙවිය යුතු ණය යටතේ රු.12,035 ක ණය ශේෂයක්ද අත්තිකාරම් ගිණුමෙහි දක්වා තිබූ අතර එම වැරදි සටහන් හඳුනාගෙන මාස 03 ක සිට වසර 05 ක් දක්වා කාල පරාසයක් ගතවී ඇතත් ගිණුම් නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි. | මෙම ණය ශේෂ වලින් වසර 05 ක කාලයක් නිරවුල් කිරීමට කටයුතු සිදු වී නැත්තේ රු.80,300 ට අදාල ණය ශේෂ පමණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

**2.3 බැංකු ගිණුම් මෙහෙයවීම**

---------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හල්දුම්මුල්ල හා ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2020 දෙසැම්බර් 31 දින දක්වා නිකුත් කරන ලද රු. 57,016,464 ක චෙක්පත් 66 ක් මු.රෙ.388 හා මු.රෙ.389 ප්‍රකාරව ආදායකයන් වෙත භාර නොදී 2021 පෙබරවාරි 16 දින වන විටත් කාර්යාලයේ රඳවාගෙන තිබුණි. එමෙන්ම එම චෙක්පත් නිකුත් කළ දින සිට දින 30 ක වලංගු කාලය ද ඉකුත් වී තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත | මු.රෙ.389 ප්‍රකාරව චෙක්පත් අදාල ආදායකයන් වෙත භාර දීමට කටයුතු .කල යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්ය සාධනය**

-----------------

**ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2014 වර්ෂයේ පළාත් නැගුම සංවර්ධන වැඩසටහන යටතේ මරංගහවෙල සායන මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් විසින් කොන්ත්‍රාත්කරු සමඟ 2014 අගෝස්තු 27 දින රු. 1,983,794 ක වටිනාකමකට ගිවිසුමකට එළඹ තිබුණි. 2017 මාර්තු 21 දින වැඩ නිම නොකල මෙම ගොඩනැගිල්ල හල්දුම්මුල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වෙත භාර දී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම සඳහා රු.1,954,000ක් වැය කර | පිළිතුරු ලබාදී නොමැත. | වැඩ නිමකර භාවිතයට ගැනිමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. 2021 පෙබරවාරි 23 විගණන දින වන විට ද මෙම ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවති අතර ගොඩනැගිල්ල සම්බන්ධයෙන් සිදුකළ භෞතික පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.<br><br>I. ගොඩනැගිල්ල අනාරක්ෂිතව පැවති අතර ප්‍රවේශ මාර්ගයක් ඉදිකර නොතිබුණි.<br>II. ගෙබිම, සිවිලිම හා පිටත කපරාරුව නිමකර නොතිබුණි.<br>III. ජලය, විදුලිය හා වැසිකිළි පහසුකම් සපයා නොතිබුණි.<br>IV. ගොඩනැගිල්ලේ සවිකර තිබුණු දොරවල් හා ජනෙල් වලට හානි සිදුකර තිබුණු අතර අපචාර ක්‍රියා සඳහා භාවිතා කර තිබුණු බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2014 වර්ෂයේ පළාත් නැගුම සංවර්ධන වැඩසටහන යටතේ උස්සැල්ල සායන මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් විසින් 2014 අගෝස්තු 20 දින රු. 1,999,998 ක ගිවිසුමකට එළඹ තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ඉදිකිරීම සඳහා රු.1,773,300 ක් වැය කර තිබුණු අතර, ගොඩනැගිල්ල සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත භාරදී නොතිබුණි. 2021 පෙබරවාරි 23 විගණන දිනය වන විටද ගොඩනැගිල්ල සායන කටයුතු සඳහා භාවිතයට ගෙන නොතිබුණු අතර, ගොඩනැගිල්ලේ සිවිලිම සකස් කර නොතිබුණි. එමෙන්ම ජලය, විදුලිය හා සනීපාරක්ෂක පහසුකම් ද සපයා නොතිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | වැඩ නිමකර භාවිතයට ගැනිමට කටයුතු කල යුතුය. |

## 3.2 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ලුණුගල හොප්ටන් බී කොටසට ජලය ලබා දීම - ආර්ථීක සංවර්ධන අමාත්‍යාංශය** | | |
| ආර්ථීක සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ඉහත ව්‍යාපෘතිය සඳහා ලුණුගල ප්‍රාදේශීය ලේකම් විසින් 2017 ඔක්තෝබර් 12 දින පෞද්ගලික කොන්ත්‍රාත්තු ආයතනයක් සමඟ රු.2,661,859 ක ගිවිසුමකට එළඹ තිබුණි. 2017 දෙසැම්බර් 12 දින ව්‍යාපෘතියේ වැඩ අවසන් කල යුතු වුවද කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත 2019 දෙසැම්බර් 12 දින දක්වා අවස්ථා 05 කදී ඉදිකිරීම් ගිවිසුමේ කාලය දීර්ඝ කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.906,558 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණද කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතියේ වැඩ අත්හැර දමා තිබුණි. කොන්ත්‍රාත්තුවට අදාල කාර්යය සාධන සුරක්ෂණ ඇපකරයේ වලංගු කාලය දීර්ඝ කර නොගැනීම නිසා කොන්ත්‍රාත්කරු විසින් ඇපකරය නිදහස් කරගෙන තිබුණු අතර රජයට අයකර ගත හැකිව තිබුණු රු.133,093 ක් අයකර ගැනීමට නොහැකිවී තිබුණි. | රජයට සිදු වූ පාඩුව වන රු.133,093.00 ක මුදල අදාල කොන්ත්‍රාත් ආයතනය විසින් වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදුකරන සංවර්ධන ව්‍යාපෘතියක් හරහා රජයට අයකර ගැනීමට තීරණය කර ඇත. අතර එයට අදාල මුදල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබාදෙන ලෙස වැලිමඩ ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර චෙක්පත ලැබුණු වහාම රජයේ ආදායමට බැරකරන බව. | ඉදිකිරීම් ව්‍යාපෘති නිරන්තරයෙන් අධීක්ෂණය කල යුතු අතර ඇපකර වල වලංගු කාලය දීර්ඝ කර ගත යුතුය. |
| **(ආ) ව්‍යාපෘති ගිණුම් වල වූ මුදල් ශේෂ** | | |
| බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15 ක්ආවරණය වන පරිදි තෝරා ගන්නා ලද ග්‍රාමශක්ති ජනතා සමිති 48 ක් සඳහා විවිධ ව්‍යාපෘති වෙනුවෙන් එක් සමිතියකට රු.1,000,000 බැගින් 2018 හා 2019 වර්ෂ වලදී රු.48,000,000 ක් ලබා දී තිබුණි. එහෙත් 2021 පෙබරවාරි 25 දින වන විටත් ඉන් රු.38,151,040 ක මුදලක් ව්‍යාපෘති සඳහා යොදා නොගෙන බැංකු ගිණුම්වල නිෂ්කාර්යව රඳවා තිබුණි. | ග්‍රාම ශක්ති ජනතා සමිති සමාගම් ලෙස ලියාපදිංචි කිරීම නිසා වෙනම ආයතනලෙස කටයුතු කරයි. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කෙරෙහි ග්‍රාම ශක්ති ජනතා සමිති නිලධාරීන්ගේ උනන්දුව අඩු බැවින් බැංකු ගිණුම් වල මුදල් ඉතිරි වී ඇත. | ව්‍යාපෘති පිලිබඳ අධීක්ෂණ හා පසුවිපරම් කල යුතුය. |

## 3.3 පාඩු හා හානි

-------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) **පාඩු හා හානි**<br>---------------<br>රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහනයක් 2017 ජූලි 29 දින අනතුරකට ලක්වීමෙන් රු.6,349,333 ක අලාභ හානියක් සිදු වී තිබුණු අතර ඒ වෙනුවෙන් රක්ෂණ සමාගම විසින් 2020 ජූනි 25 දින ගෙවන ලද රු. 2,500,000 ක මුදල පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. 2020 පෙබරවාරි 10 දින වන විට ද වාහනය අළුත්වැඩියා කර නොතිබුණු අතර අනතුර සිදුවීමෙන් වසර 03 1/2 ක පමණ කාලයක් අනතුරට පත් වූ රථය දිස්ත්‍රික් ලේකම් කාර්යාල රථගාලේ නිෂ්කාර්යව ගාල් කර තිබුණි. මු.රෙ.104 (4) ප්‍රකාරව අනතුර සම්බන්ධයෙන් වූ පරික්ෂණ මණ්ඩලයේ වාර්තාව අනුව රක්ෂණ සමාගම විසින් නොගෙවන ප්‍රමාණය අදාල පාර්ශවයන්ගෙන් අයකරගෙන නොතිබුණි. | මු.රෙ.104(4) ප්‍රකාර අවසන් පරීක්ෂණ වාර්තාව අනුව උපරිම වගකීම රු.3,060,000 ක් වූ අලාභ හානිය තක්සේරු කිරීමෙන් අනතුරුව රක්ෂණ ආයතනය ලබා දුන් තක්සේරු මුදල රු.2,500,000 කි. | අලාභ හානිය පිලිබඳ පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව අනුව කටයුතු කල යුතුය. |
| (ආ) බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල භාරයේ පැවති වාහන 07 ක් අනතුරට පත්වී වසර 02 සිට වසර 22 දක්වා කාල පරාසයක් ගත වී ඇතත්, සිදු වූ අලාභයේ වටිනාකම රු.6,046,930 ක් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ විධිමත් අනුමැතියක් යටතේ පොත් වලින් කපා හැරීමට හෝ සමාලෝචිත වර්ෂයේ අවසානය වන විට දකටයුතු කර නොතිබුණි. | මෙම අලාභහානි සියල්ල නිසි පරිදි පරීක්ෂණ කටයුතු සිදු නොකර පෙර වර්ෂ වල සිට පැවත එන අලාභහානි බව | අලාභ හානි පිලිබඳ පරීක්ෂණ මණ්ඩලයේ වාර්තා අනුව කටයුතු කල යුතුය |

**3.4** **කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ උපලේඛන ගත නිවාස හිමි තනතුරු 03 ක් සඳහා කාර්යාලයේ සිටින නිලධාරීන් සංඛ්‍යාව අනුව අවශ්‍ය නිවාස ගණන 04 ක් වුවද උපලේඛනගත නිවාස 06 ක් පවත්වා ගෙන ගොස් තිබුණි. | සාකච්ඡා කර අවශ්‍ය පියවර ගනිමින් සිටින අතර ඉදිරියේදී විගණනය සඳහා දැනුම් දෙන බව | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| (ආ) | උපලේඛන ගත නිවාසයක් සඳහා අයවිය යුතු රු.244,667ක හිඟ නිවාස කුලී සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද අයකර ගෙන නොතිබුණි. | එක් නිවසක හිඟ කුලිය වූ රු.87,403 ක් අයකර ගෙන ඇති අතර අනෙක් නිවාසයේ හිඟ කුලිය වූ රු.244,667 ක් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ විධිවිධාන අනුව නිවාස කුලිය අයකර ගත යුතුය. |
| (ඇ) | බදුලුපිටිය මුදුන්පිට ගොඩැල්ල ඉඩමේ වට අඩි 19 අඟල් 06 ක් හා උස අඩි 75 ක් පමණ වූ මැහෝගනී වර්ගයේ ගසක් කපා හෙළීම සඳහා බදුල්ල ප්‍රාදේශීය ලේකම් විසින් 2020 ජනවාරි 31 දින රඹුක්පොත රජමහා විහාරයේ භාරකරු වෙත අවසර පත්‍රයක් නිකුත් කර තිබුණි. කපා හෙලන ලද ගස අයත් ඉඩම සම්බන්ධයෙන් බදුල්ල මහ නගර සභාව විසින් අයිතිය දැක්වෙන ලියවිලි ඉදිරිපත් කර තිබුණු අතර 2021 පෙබරවාරි 12 දින වන තෙක් ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩමේ නිරවුල් අයිතිය සනාථ කරගෙන නොතිබුණි. කපා හෙලන ලද වටිනා මැහෝගනී දැව කොටස් කපා හෙලන ලද ස්ථානයේ අනාරක්ෂිතව දිරාපත් වෙමින් පැවතුනි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | දැව හෙළීම නියමිත විධිවිධානවලට අනුකූලව සිදුකල යුතු අතර කපා හෙලන ලද දැව සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු ය. |

**4.** **යහපාලනය**

**------------**

**අභ්‍යන්තර විගණනය**

**----------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කර නොතිබුණි. | රට තුල පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක පමණක් අභ්‍යන්තර විගණනය සිදුකරන ලදී. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 49 වගන්තිය ප්‍රකාරව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කල යුතුය. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ. | කාර්යය මණ්ඩල තොරතුරු සෑම මසකම ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ ද පලකරන බැවින් එම අමාත්‍යාංශය ද කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවද දැනුවත්ව ඇත. | අනුමත කාර්යය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුය |

| සේවා වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---:|---:|---:|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 57 | 41 | 16 |
| තෘතියික මට්ටම | 48 | 28 | 20 |
| ද්විතියික මට්ටම | 1170 | 1011 | 159 |
| ප්‍රාථමික මට්ටම | 139 | 132 | 07 |
| එකතුව | 1414 | 1212 | 202 |

මේ අනුව අනුමත කාර්ය මණ්ඩලය තුල වූ පුරප්පාඩු 202 ක් පුරවා නොතිබුණි